# 09 අතිපූජ්‍ය වැලිවිටියේ සිරි සෝරත නාහිමිපාණෝ

සිංහල භාෂා සාහිත්‍ය ක්ෂේත්‍රයට, හා අධ්‍යාපන ක්ෂේත්‍රයට අපරිමිත මෙහෙවරක් ඉටු කළ වැලිවිටියේ ශ්‍රී සෝරත මා හිමිපාණන් වහන්සේ පිළිබඳ තොරතුරු මේ පාඩමෙන් ඔබට උගත හැකි ය.



සිය අනභිභවනීය මෙහෙවරින් ජාතියේ කිත් සිරුර සැරසූ, අපරිමිත පෞරුෂ ලක්ෂණයෙන් හෙබි, උත්තුංග දේහධාරී, ගැඹුරු හඬින් ස්වකීය ප්‍රඥා පාටවය සංකේතවත් කළ, විසිවන සියවසේ ලක්දිව පහළ ව ලක්මව අභිමානවත් කළ උදාර බුද්ධ පුත්‍රයාණ කෙනෙකි, අතිපූජ්‍ය, රාජකීය පණ්ඩිත, සාහිත්‍ය චක්‍රවර්ති, මහෝපාධ්‍යාය ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, වැලිවිටියේ ශ්‍රී සෝරත මාහිමිපාණෝ. "මේ මාගේ ය, මේ අනුන්ගේ යයි සිතන්නෝ බොල් අදහස් ඇත්තෝ වෙති. උදාර සිත් ඇති උතුමනට මුළු ලොව ම එක ම පවුලකි" යන මහා කවි විෂ්ණු ශර්මන් පඬිවරයාගේ කියමන සනාථ කරමින් මුළු ලෝකයා කෙරෙහි සමසිතින් සාධාරණ ව සිතූ සෝරත මාහිමිපාණෝ දුලබ උතුමෙකු වූ සේක.

රන්වලගොඩින් මූලික අධ්‍යාපනය ලබා හික්කඩුවේ තිලකාරාමයේ විහාරාධිපති ව වැඩ විසූ කහවේ පේමරතන මාහිමිපාණන් වහන්සේ වෙතින් 1912 වප් මස 15 වන දින සුබ නැකතින් මෙතුමෝ පැවිදිබිමට පිළිපන්හ. පුරාකෘත පුණ්‍ය බල මහිමයෙන් කුඩා සෝරත සාමණේරයන් වහන්සේ ඉගෙනීමෙහි ඉමහත් ආසාවක් දක්වූහ.

1917 වසරේ දී ගුරු හිමියන්ගේ උපදෙස් අනුව සෝරත සාමණේරයෝ විද්‍යෝදය පිරිවෙනට ඇතුළු වූහ. තල්මසකුට වඩා විශාල ශරීරයක් ඇති තිමිර තිමිංගල මත්ස්‍ය රාජයකුට ක්‍රීඩා කිරීම පිණිස පොකුණත්, විලත්, ගංගාවත් ප්‍රමාණවත් නො වේ. ඒ සත්ත්වයාගේ ශරීර ප්‍රමාණය අනුව මහා සාගරය ම අවශ්‍ය වේ. එමෙන් ම වැලිවිටියේ සෝරත මාහිමියනට තම නැණ නුවණ උරගා බැලීමට එදා දහස් ගණන් ප්‍රවීණ පැවිදි ශිෂ්‍යයන් හා සිය ගණන් ආයුර්වේද ශිෂ්‍යයන්ගෙන් ද පිරී ගිය විද්‍යෝදය පිරිවෙණ ම සුදුසු විද්‍යාස්ථානයක් විය.

දින කීපයක් තුළ ධම්මපදයේ ගාථා 423ක් කටපාඩම් කර ගනිමින් සිය ගුරුහිමියනට සිය දක්ෂතාව පෙන්වූ උන්වහන්සේ, පිරිවෙන් අධ්‍යාපනයක් නොලැබ ගුරුහිමියන්ගෙන් අර්ථ අසාගෙන ප්‍රාචීන පණ්ඩිත උපාධිය උසස් ලෙස සමත් ව උභයශේඛර ස්වර්ණ මුද්‍රිකාව ද දිනාගැනීමට සමත් වූ සේක.

තම උගත්කම කාරක මහා සංඝයා වහන්සේ ඉදිරියේ ප්‍රදර්ශනය කරමින් මහනුවර මල්වතු විහාරයේ උපෝසථ සීමා මාලකයේ දී උපසම්පදාව ලබා ගත් උන්වහන්සේට එවකට විද්‍යෝදය පිරිවෙනේ අධිපති ව වැඩ විසූ මහගොඩ ශ්‍රී ඥානේශ්වර නායක හිමිපාණන් ද කහවේ පේමරතන, හික්කඩුවේ පේමානන්ද යන හිමිපාණන් වහන්සේලා ද ගුරු වූ සේක. සෝරත මාහිමියෝ පිරිවෙණේ අවසන් වසරේ ඉගෙනුම ලබද්දී ම එකල විද්‍යෝදය පරිවෙණාධිපති ව වැඩ විසූ  කහවේ ශ්‍රී රතනසාර නාහිමියන් විසින් ආචාර්ය පදවියකට පත් කරන ලදහ. දඹදිව නාලන්දා මහා විහාරායතන විශ්වවිද්‍යාලයේ පරිහානියෙන් පසු පෙරදිග ලෝකයට ශාස්ත්‍රාලෝකය ලබාදුන් විද්‍යෝදය පිරිවෙණෙහි ආචාර්ය පදවියක් ලැබීම උන්වහන්සේගේ උගත්කමට ලැබුණු උසස් පිළිගැනීමක් විය.

සෝරත මාහිමිපාණන් වහන්සේගේ ශාස්ත්‍රධරත්වයත් ධර්මධරත්වයත් මතු ව පෙනෙන්නේ උන්වහන්සේ විසින් සංස්කරණය කරන ලද ග්‍රන්ථ දෙස බැලීමෙනි. වත්මන් පඬිවරුන්ට පවා අර්ථාවබෝධයට අපහසු කව්සිළුමිණ, කාදම්බරිය වැනි චිර සම්භාවිත ග්‍රන්ථ රැසක් සඳහා සෝරත හිමිපාණන් විසින් ව්‍යාඛ්‍යාන පරිකථා ලියැවිණි. කව්සිළුමිණ කල්පලතා නමින් පළ කළ ව්‍යාඛ්‍යානය ශාස්ත්‍රාභිලාෂීන්ගේ සිත් ගත් කෘතියක් විය. පරෙවි සන්දේශය ආදි සන්දේශ ග්‍රන්ථ ද, අමාවතුර, බුත්සරණ, දහම්සරණ, සඟසරණ ආදි ග්‍රන්ථ මෙන් ම දහම්සොඬ දා කව වැනි ග්‍රන්ථ ද උන් වහන්සේ අතින් සංශෝධනය විය.

සෝරත සංස්කරණයන්හි දක්නට ලැබෙන විශාරද හා පර්යේෂණාත්මක බව ආවාට ගියාට ඇති වූවක් නො වේ. උන්වහන්සේ සිය කාර්යයෙහි මනා ව නියැලුණහ. කව්සිළුමිණ කල්පලතා ව්‍යාඛ්‍යානය සංස්කෘත, පාලි, හා සිංහල සාහිත්‍ය ග්‍රන්ථ අනූ දෙකකින් උපුටාගත් කරුණුවලින් උපලක්ෂිත ය. සිංහල සාහිත්‍යාර්ණවයේ පරතෙර දුටු අයකුට ම මිස අන් කිසිවෙකුහට මෙවැන්නක් කළ නො හැකි ය. සෝරත මාහිමිපාණන් වහන්සේ විසින් සකසන  ලද දළදා පහන නම් වූ ගැටපද විවරණයෙන් දළදා සිරිත ද ආලෝකවත් වූ බව සාහිත්‍ය විශාරදයෝ දුටහ.

මේ සියලු කාර්යයන් පරදවා උන්වහන්සේ කළ විශිෂ්ටතම කෘතිය ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයයි. විශේෂ  කාර්ය මණ්ඩලයක් නොමැති ව, තමන් වහන්සේ ඇසුරු කළ හිතෛෂීන් ස්වල්පදෙනකුගේ සහාය ලබාගෙන අවුරුදු කිහිපයක් තුළ දී ශ්‍රී සුමංගල  ශබ්දකෝෂය ලියා නිම කිරීම විශාල ජයග්‍රහණයක් බවත්, පසු කලෙක පිහිට වූ විද්‍යෝදය විශ්වවිද්‍යාලය පාලනය කිරීමට තමන් වහන්සේට අත්‍යන්තයෙන් ම උපකාරී වූයේ කල්කටා විශ්වවිද්‍යාලයෙන් ලත් අත්දැකීම් බවත් උන්වහන්සේ නිහතමානී ව ප්‍රකාශ කළ සේක.

1941 දී කල්කටා විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍යත්වයක් ලැබ එහි වැඩම කළ සෝරත මා හිමිපාණෝ එහි දී පාලි, සංස්කෘත, ප්‍රාකෘත, වංග ආදි පෙරදිග භාෂාවන්හි ද, ඉංග්‍රීසි, ජර්මන් ආදි අපරදිග භාෂාවන්හි ද දැනුම තර කර ගනිමින් පර්යේෂණ කටයුතුවල යෙදුණහ. දෙමළ භාෂාව පිළිබඳ ව සෝරත මා හිමිපාණන්ට මනා අවබෝධයක් විය.

සංස්කෘත භාෂාව හදාරන්නවුන්ටත් සිංහලයේ සංස්කෘත, තත්සම හා තද්භව වචන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටත් හැකි වන පරිද්දෙන් උන්වහන්සේ ලියූ 'සංස්කෘත ශබ්දාර්ණවය' නම් වූ ශබ්ද කෝෂය අතිශයින් ම අගය කළ යුතු ය.

සෝරත මාහිමිපාණන් විසින් විවිධ විෂයයන් යටතේ ලියන ලද ලිපි එවක වූ විද්වතුන් විස්මයට පත් කළේ ය. උන්වහන්සේගේ සුරත මෙහෙයවුණේ වියතුන් හා වැඩිහිටියන් සඳහා පමණක් නො වේ. නූතන කථා සම්ප්‍රදායට ඉතා ළං වූ සුමිහිරි බසකින්, උන් වහන්සේ ලියූ 'කථාමෘතය' කතා පෙළ සැබැවින් ම අමෘතයක් ම විය.

එහිලා භාවිත කළ ප්‍රිය, සුබනමාෘ, ප්‍රාණවත්, සරල භාෂා ශෛලියට පහත දැක්වෙන උපුටනය උදාහරණ වේ.

"රිදී දිය දහර වැනි නිමල් සිහිල් සඳරැසින් මිහිකත නැහැවෙන්නට වන. නිල්වන් ගුවන් තෙලෙහි දිලිසෙන විසිතුරු තුරු පෙළ සෙයින් කුසුම් පුබුදු වන්නට විය .........."

(කථාමෘතය)

සෝරත මාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් 1959 නවම් මස 15 වන දින ආරම්භ කළ විද්‍යෝදය විශ්වවිද්‍යාලය ද සිංහල භාෂා සාහිත්‍යයට කළේ අතිවිශිෂ්ට සේවයකි. සිංහල භාෂාව වෙනුවෙන් සිය දිවි කැප කිරීමට වුව සූදානමින් සිටි සෝරත මාහිමිපාණෝ අප අධ්‍යාපන ඉතිහාසයට නව පිටුවක් එක් කරමින් විද්‍යෝදය විශ්වවිද්‍යාලය ඇරඹූ සේක. එය උන්වහන්සේගේ අප්‍රතිහත ධෛර්යය නිසා ම ඇති වූවකි. විශ්වවිද්‍යාල සිසුන්ගේ හැසිරීම් පිළිබඳ ව ද උන්වහන්සේ දැක්වූයේ වෙනස් ආකල්පයකි.

"විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් විප්ලවකාරී විය යුතු ය. එහෙත් ඥනවන්ත ව ක්‍රියා කළ යුතු ය......." යන්න උන් වහන්සේගේ අවවාදය විය. පොත පත කෙරෙහි මෙන් ම ක්‍රියා සංවිධානයේ දී ද උන්වහන්සේ පෙන්වූයේ අසාමාන්‍ය දක්ෂතාවකි. අනිකුත් සරසවි අභිභවා යාමට එතුමන්ගේ තීරණ ඉවහල් විය. පුරාවිද්‍යාව පිළිබඳ ව උන්වහන්සේ දැක්වූයේ අපමණ ගෞරවයකි. විදුදය සරසවියට ආ සිසුනට පුරාවිද්‍යාව විෂය ඉගැන්වීමෙන් උන්වහන්සේ ලැබූයේ ඉමහත් තෘප්තියකි. ප්‍රථමවරට ශ්‍රී ලංකා සරසවියක පුරාවිද්‍යා අංශයක් ඇති කෞතුකාගාරයක් ද තනා අද පවත්නා පුරාවිද්‍යා ප්‍රබෝධයට උන්වහන්සේ උදවු දුන් සේක. සරසවි සිසුනට බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි හා බුද්ධ ධර්මය අනිවාර්ය කළ සේක.

ස්වකීය පාණ්ඩිත්‍යය හා සේවය පිළිබඳ ව උන්වහන්සේ වෙත වූයේ මහත් තෘප්තියකි. ඒ බව උන්වහන්සේ විසින් විශ්වවිද්‍යාලයීය සමාරම්භක මහෝත්සවයේ දී කළ පහත සඳහන් ප්‍රකාශයෙන් පැහැදිලි වේ. "අපේ ඉගෙනීමට ආධාර කළ දුප්පත් පන්සල්වලට අප දූන් ණය නැත. මා උගත් පිරිවෙණට ද සතිස්වසක් සේවය කර තිබේ. මා නැති වුව ද මගේ රටට අවුරුදු දෙතුන් සියයක් වත් අමතක නොවන තරම් කෘතියක් දෙකක් අප අතින් සම්පාදනය වී ඇත. මගේ මුළු ජීවිතය ම විශ්වවිද්‍යාලයට කැප කිරීමට මා අදිටන් කොට අවසාන ය.........."

උන් වහන්සේ නිසා විශ්වවිද්‍යාලය ගොඩ නැගුණා මිස විශ්වවිද්‍යාලය නිසා උන් වහන්සේ ගොඩ නැගුණේ නැත.

සෝරත මාහිමිපාණෝ රුසියානු ආණ්ඩුවේ බෞද්ධ සංගමයේ ආරාධනය පරිදි රුසියාවට වැඩම කළහ. ඒ විදේශ සංචාරයකින් ලබන තෘප්තිය අපේක්ෂාවෙන් නො වේ. එහි වූ විශ්වවිද්‍යාල පරීක්ෂා කොට ඒවායේ ගොඩනැගිලි තනා ඇති අයුරු, භාවිත කෙරෙන විෂය මාලා, ඉගැන්වීම් ක්‍රම, ශිෂ්‍ය පාලනය, කථිකාචාර්යවරුන්ගේ වගකීම, පුස්තකාල සකසා ඇති අයුරු ආදි අංග පිළිබඳ ව හදරා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ද එම වැදගත් අංග ක්‍රියාත්මක කිරීමේ අභිලාෂයෙනි.

රුසියාවේ දී නුහුරු නුපුරුදු දේශගුණය හා ආහාර හේතු කොටගෙන ගිලන් වුව ද ප්‍රතිකාර ලබා තරමක් සුවපත් වූ උන් වහන්සේ දහසක් අපේක්ෂා ඇති ව ආපසු දිවයිනට වැඩම කළහ. තෙහෙට්ටුව මඟ හරවා විවේක ගැනීම් වස් රෝහල වෙත පැමිණි උන්වහන්සේ යළිත් ගිලන් වූ සේක. විද්වත්හු, ඇමැතිවරු, භික්ෂූන් වහන්සේ ආදි පිරිස් උන් වහන්සේ වට කරගෙන සිටියහ. ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ පිරිත් සජ්ඣායනා කළහ. එහෙත් උන්වහන්සේගේ අවසන් මොහොත ළඟා වෙමින් පැවති බව වෛද්‍ය වාර්තාවලින් දැනගන්ට ලැබිණ.

දකුණු සිරිලක පඬිවරුනට ආකරයක් වූ ගාලු ගඟබඩ පත්තුවේ වැලිවිටිය යන ග්‍රාමවරය ජන්ම භූමිය කොටගත් උන් වහන්සේ පැරණි සම්භාවනීය පරපුරක් වූ කුමාර ශ්‍රී වර්ධන පරම්පරාවට අයත් වූ සේක. උන් වහන්සේ මෙලොව පහළ වූ ඒ අසිරිමත් දිනය 1897 වෙසක් මස 23 වන දා ය. 1963 ඇසළ මස 17 වන දින විදුදය සරසවියේ ඇදුරු මඬුල්ල හා සිසු පිරිස ද ලක්වැසි මුළු මහත් බෞද්ධ ජනතාව ද සෝ සයුරේ ගිල්වමින් උන් වහන්සේ මෙලොවින් සමුගත් සේක.

1. **පාඩම හඬ නගා කියවන්න.**

## අරුත් පැහැදිලි කිරීම්

| | | |
|---|---|---|
| අත්‍යන්තයෙන් | . | සම්පූර්ණයෙන් |
| අප්‍රතිහත ධෛර්යය | . | නොපසුබස්නා උත්සාහය |
| කිත් සිරුර | . | කීර්ති ශරීරය |
| ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය | . | ත්‍රිපිටකය පිළිබඳ ව විශාරද දැනුම ඇති |
| ධර්මධරත්වය | . | ධර්මය දන්නා බව |
| පරිකථා | . | විස්තරාර්ථ වර්ණනා |
| පුරාකෘත | . | පෙර කරන ලද |
| ප්‍රඥා පාටවය | . | බුද්ධි ප්‍රභාව |
| විස්මයාවහ | . | විස්මය උපදවන/ විස්මය වහනය කරන |
| සාහිත්‍යාර්ණවය | . | සාහිත්‍යය (නමැති) මුහුද |
| හිතෛෂීන් | . | හිතවතුන් |

## ක්‍රියාකාරකම 01

2. **පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

   i. මහා කවි විෂ්ණු ශර්මන් පඬිවරයාගේ කියමනක් මේ පාඩමේ ඇත. එය උපුටා දක්වන්න.
   ii. සෝරත මාහිමිපාණන් වහන්සේ ගිහි කල අයත් වූයේ කුමන පරම්පරාවට ද ?
   iii. වැලිවිටියේ සෝරත මාහිමිපාණන්ට තම නැණ නුවණ උරගා බැලීමට සුදුසු ස්ථානය වූයේ කුමක් ද ?
   iv. සෝරත මාහිමිපාණන් වහන්සේ සංස්කෘත, පාලි, සිංහල පොත්පත් රැසක් පරිශීලනය කළ බවට සාධකයක් පාඩමේ දැක්වේ. ඒ කුමක් ද?
   v. දඹදිව නාලන්දා විශ්වවිද්‍යාලයේ පරිහානියෙන් පසු පෙරදිගට ශාස්ත්‍රාලෝකය ලබා දුන්නේ කුමන ආයතනයක් ද ?

1. **කළු අකුරින් ඇති පද වෙනුවට යෙදිය හැකි පද වරහන් තුළින් තෝරා ලියන්න.**

## ක්‍රියාකාරකම 02

   i. වැලිවිටිය නම් වූ **ග්‍රාමවරය** උන්වහන්සේගේ **ජන්ම භූමිය** විය.
   ii. දකුණු සිරිලක, **පඬිවරුනට** තෝතැන්නක් විය.
   iii. **පුරාකෘත** පුණ්‍ය මහිමයෙන් කුමරු ඉගෙනීමේ දක්ෂ විය.
   iv. උන්වහන්සේට ශාස්ත්‍රාලෝකය ලබා දුන් **විදුදය** පිරිවෙණෙහි ම ආචාර්ය පදවියක් හිමි විය.
   v. කව්සිළුමිණ ව්‍යාඛ්‍යානය සාහිත්‍ය ග්‍රන්ථ අනූදෙකකින් ලද කරුණුවලින් **උපලක්ෂිත** ය.
   vi. උන්වහන්සේට **විස්මයාවහ භාෂාන්තර ඥානයක්** හා **බහුශ්‍රැත** බවක් විය.
   vii. ගිලන් වුව ද උන්වහන්සේගේ **අභිලාෂය** දත් භික්ෂූහු පිරිත් සජ්ඣායනය කළහ.

(විශ්වවිද්‍යාලයෙන්, පෙර කරනලද, බොහෝ ඇසූ පිරූ තැන් ඇති, විද්වතුනට, නිජ භූමිය, පුදුම එලවන, සමන්විත, ගුරු තනතුර, උතුම් ගම, අවසානය, දැඩි කැමැත්ත, විද්‍යාලෝකය, පින් බලයෙන්, විවිධ භාෂා පිළිබඳ දැනුම, අසනීප, විද්‍යෝදය, විස්තර කිරීම)

2. **පහත සඳහන් පද යොදා අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය තනන්න.**

i. උත්තුංග දේහධාරී
ii. සමසිතින් සාධාරණ ව සිතන
iii. සම්භාවනීය පරපුරක්
iv. ශාස්ත්‍රාලෝකය ලබා දුන්
v. ශාස්ත්‍රධරත්වයත්, ධර්මධරත්වයත්
vi. ඇසුරු කළ හිතෛෂීන් ස්වල්ප දෙනෙක්
vii. නිහතමානී ව ප්‍රකාශ කළහ.
viii. විස්මයාවහ හැකියාවක් විය.
ix. අප්‍රතිහත ධෛර්යය නිසා ම
x. වෙනස් ආකල්පයකි.
xi. අපූරු කාර්මික ඥානයක්
xii. පිරිත් සජ්ඣායනය

3. **පහත සඳහන් පද විසන්ධි කර දක්වන්න.**

i. සාහිත්‍යාර්ණවය
ii. මහෝපාධ්‍යාය
iii. වාගීශ්වරාචාර්ය
iv. තිලකාරාමාධිපති
v. විද්‍යාස්ථානයක්
vi. ඥනේශ්වර
vii. ශාස්ත්‍රාලෝකය
viii. අර්ථාවබෝධය
ix. සම්ප්‍රදායානුකූල
x. මහෝත්සවය

## ක්‍රියාකාරකම 03

- **පන්තිය කණ්ඩායම් පහකට බෙදී සෝරත නාහිමි ජීවන චරිතයට අදාළ පහත සඳහන් මාතෘකා ඔස්සේ කරුණු පෙළ ගස්වන්න.**

i. අධ්‍යාපනය හා විශේෂ කුසලතා
ii. සාහිත්‍ය සේවය
iii. විශ්වවිද්‍යාලය පිහිටුවීම
iv. භාෂා ඥනය
v. සෝරත නාහිමියන්ගේ ආකල්ප

## ක්‍රියාකාරකම 04

**"උන් වහන්සේ සමත් වූ සේක."**

පාඩමෙන් උපුටා ගැනුණු ඉහත සඳහන් වාක්‍යයේ උක්ත පදය **උන් වහන්සේ** යන්නයි. එහි ආඛ්‍යාතය **සමත් වූ සේක** යනුවෙන් තබා ඇත. ඒ අනුව ඉහත වැකිය සිංහල භාෂාවේ විශේෂ වාක්‍ය රීතියක් වේ. මේ පිළිබඳ සැලකිලිමත් ව පහත සඳහන් අභ්‍යාසවල යෙදෙන්න.

- **පහත සඳහන් වාක්‍යවල උක්ත හා ආඛ්‍යාත පද නිවැරදි ව ගැළපෙන සේ හිස්තැන් සම්පූර්ණ කරන්න.**

i. එම ආරාමයේ විහාරාධිපතීන් වහන්සේ තම දායක නිවසක පිරිත් සජ්ඣායනයක් සඳහා වේලාසනින් ම ..........................................

ii. ................................................ සාවුරුද්දක් දුෂ්කර ක්‍රියාවෙන් පසු මැදුම් පිළිවෙත අනුගමනය කොට අසම සම ලොවුතුරා බුද්ධත්වයට පත් වූ සේක.

iii. මහසෙන් රජ්ජුරුවෝ රජරට සහලින් ස්වයං පෝෂණය කිරීම සඳහා වැව් රාශියක් ..............................

iv. කලාකාමියකු වූ කාශ්‍යප රජතුමා ආලකමන්දාව වැනි වූ සීගිරිය ..............................

v. අපගේ ආදරණීය මෑණියන් දෑ නිතර ම අප සනසන ................................................

vi. මහැදුරු සරච්චන්ද්‍රයෝ සිංහල නාට්‍ය කලාවේ නව නැම්මක් ...................................

vii. රජතුමාගේ අග්‍ර උපදේශක මහෞෂධ .................................. තමන් හමුවට ආ සියලු පැන විසඳූහ.

viii. නිදහස් උත්සව දිනයේ දී ගුවන්යානාවෝ රාශියක් උත්සව භූමියට ඉහළින් පියාසර ....................................

ix. පල බරින් නැමුණු ............................................ පක්ෂීන්ට අහර හා සුවය සලස්වති.

x. කලකට පසු ව ඇද වැටුණු විශාල වර්ෂාවක් නිසා ගඟ අසබඩ තිබුණු ගෙවල් රාශියක් හා ගස්වැල් රාශියක් ...................................

### පැවරුම්

1. **වැලිවිටියේ ශ්‍රී සෝරත මා හිමිපාණන් පිළිබඳ තවත් කරුණු සොයා පොත් පිංචක් සකසන්න.**
2. **පහත සඳහන් විද්වතුන් භාෂා සාහිත්‍යයට කළ සේවය අළලා කෙටි චරිත කථා ලියන්න.**

**යක්කඩුවේ ප්‍රඥාරාම හිමි**
**කුමාරතුංග මුනිදාස මහතා**
**මාර්ටින් වික්‍රමසිංහ මහතා**
**මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා**